## 2.17 නිඛිල එකතු කිරීම් හා අඩු කිරීම් උපකරණය



හැඳින්වීම:- ලී පුවරුවක් මත සවි කළ විශ්කම්භය 22cm වන වෘත්තාකාර තැටියක් එහි කේන්ද්‍රය වටා භ්‍රමණය කළ හැකි පරිදි සැකසූ උපකරණයකි. වෘත්තාකාර තැටිය මත -9 සිට +9 දක්වා නිඛිල සංඛ්‍යා සලකුණු කර ඇත. මෙහි නිඛිල සංඛ්‍යා එකතු කිරීම සහ අඩු කිරීම යන සංකල්ප තහවුරු කිරීමට සාධන ලැබූ උපකරණයකි.

භාවිත කළ හැකි අවස්ථා :-

-9 සිට +9 දක්වා වූ නිඛිල සංඛ්‍යා දෙකක් එකතු කිරීම / අඩු කිරීම මගින් ලැබෙන අගය තහවුරු කර ගැනීම.

ගුරු උපදෙස් :-

1. නිඛිල එකතු කිරීම සඳහා උපකරණයේ b කොටස් හි " + " සහිත කවුළුව ද අඩු කිරීම සඳහා b කොටසේ " - " ලකුණු සහිත කවුළුව ද ඉහළ අගයට යොමු කර ගත යුතු වේ.
2. උපකරණයේ ඉහළ අර්ධය තුළ ක්‍රියාකාරකම් සලකා බලන්න.
3. aහි පිටත තීරයත් bහි තීරයත් දෙකෙන් අවශ්‍ය සංඛ්‍යා යුගල සම්මුඛව (සම්පාතව) තබන්න.එකතුව /වෙනස bහි කවුළුව තුළින් ලබා ගන්න.
4. එම අවස්ථාවේ ම වෙනත් නිඛිල යුගල සඳහා ද එම ඵලයම අදාළ දැයි විමසන්න.
5. bහි කවුළුවෙන් අභිමත අගයන් මතු කර පිටත සංඛ්‍යා රේඛා යුගල දෙකෙහි අනුරූප නිඛිල යුගල තුලනය සඳහාම වලංගු දැයි නිරීක්ෂණය කරන්න.

උපකරණ සහ එය එකලස් කිරීමට අවශ්‍ය උපාය



උප කොටස් දෙක



උපකරණය

(ඇ). මේ සඳහා අදාළ කාර්ය පත්‍රිකා ද සමග ඔබගේ නිර්මාණ සැලසුම් ඉදිරිපත් කරන්න.

සිසු උපදෙස් :-